“වාහනයේ ගමන් කරන්නා පා ගමනින් යන්නාටත්, පා ගමනින් යන්නා වාඩි වී සිටින්නාටත්, සුළු පිරිස බහුතර පිරිසටත් සලාම් පවසනු ඇත.”

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ප්රකාශ කළ බව අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී. “වාහනයේ ගමන් කරන්නා පා
ගමනින් යන්නාටත්, පා ගමනින් යන්නා වාඩි වී සිටින්නාටත්, සුළු පිරිස බහුතර පිරිසටත් සලාම් පවසනු ඇත.” බුහාරිහි සඳහන් හදීසයක "කුඩා අය වැඩිහිටියාටත්, ගමන් කරන්නා වාඩි
වී සිටින්නාටත්, සුළු පිරිස බහුතර පිරිසටත් සලාම් පවසනු ඇත.” [صحيح] [متفق عليه]

ජනතාව අතර සලාම් නම් සුභ පැතුම පවසන ආකාරයේ විනය නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් මඟ පෙන්වූහ. එනම්: "අස්සලාමු අලයිකුම් වරහ්මතුල්ලාහි වබරකාතුහු" කුඩා වියේ පසුවන අය වැඩිහිටියාටත්, වාහනයක ගමන් කරන්නා පා ගමනින් යන්නාටත්, පා ගමනින් යන්නා වාඩි වී සිටින්නාටත්, සුළු පිරිස බහුතර පිරිසටත් සලාම් පැවසිය යුතු වේ.

https://www.sunnah.global/hadeeth/si/show/4243